**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, please give me a minute to ask a question.

ගරු අගමැතිතුමනි, කෘෂිකර්මය ගැන කථා කරනකොට, මේ කාරණයට වහාම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නයි මම නැඟිට්ටේ. ලංකාවේ පළමු වරට ඉදිවන උෂ්ණත්වය පාලනය කරන කෘෂි ගබඩාවේ වැඩ කටයුතු දඹුල්ලේ පටන් ගත්තා.

ඒ වැඩ කටයුතු තවම ඉවර නැහැ. ඒ ඉඩම වටේට තිබුණු අනෙක් ඉඩම් කොටස් එක එක්කෙනා කොටු කරගෙන පෞද්ගලික කියලා බෝඩ් ගහගෙන දැන් ඒ ඉඩම් පුරවනවා. ඒක වෙන්න දෙන්න එපා, ගරු අගමැතිතුමනි. එතැන ඒ ගබඩාව හදලා අවසන් කරන්න ඕනෑ. ඒක ගොවි මහත්වරුන්ගේ අස්වැන්න ගබඩා කරන්න තිබෙන තැන. එතැන හැම දේම store කරන්න බැහැ. නමුත් අල ටික, ලූනු ටික, මිරිස් ටික ගබඩා කර ගන්න පුළුවන්. එම නිසා ඒ ගබඩාව හදලා අවසන් කරන්න ඕනෑ. හැබැයි, මේ දැන් එතැන තිබෙන ඉඩම පුරවනවා. ඒක නවත්වන්න, ගරු අගමැතිතුමනි. Call එකක් දෙන්න. කවුද ඒක කරන්නේ? ඒක පෞද්ගලික ඉඩමක් නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා කියන කාරණයට අපි වහා මැදිහත් වෙන්නම්. ඒ ගබඩාව හදන එක ඒ කාලයේ ADB project එකක් විධියට පටන් ගත්ත එකක්. පසුගිය කාලයේ ඒකේ ශීතකරණ සවි කරපු නැති ප්‍රශ්නය තිබුණා. ඒ ප්‍රදේශයට ගියාම ඔය වාගේ ප්‍රශ්න ඉදිරිපත් වුණා. ඔබතුමා දැන් නඟන ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න මම වහාම අවශ්‍ය උපදෙස් දෙන්නම්.

[පූ.භා. 11.06]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යවරයා අය වැය කථාව ආරම්භ කළේ, ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වෙලා තිබෙන සමජීවිකතා කියන කාරණය සඳහන් කරමින්. විශේෂයෙන්ම ආදායමට සමාන ජීවිකාවක් ක්‍රියාත්මක විය යුතුයි කියන කාරණාව ගැන කථා කරමින්. ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා, ජනාධිපතිතුමා සමජීවිකතා ආශ්‍රිතව කථාව පටන් ගැනීම ගැන. අය වැය පුරාවටම තිබෙන ලක්ෂණයක් එතුමාගේ ඉදිරිපත් කිරීම තුළ තිබෙනවා. සමජීවිකතා දේශනය තුළ සඳහන් වෙනවා, ආදායමට සමාන ජීවිකා ගැන. හැබැයි, ගරු කථානායකතුමනි, ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ඉතිරි ධර්ම තුන ගැන එතුමා කිව්වේ නැහැ. ඉතිරි ධර්ම තුන ගැන කිව්වොත් ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරයාත් -මුදල් ඇමතිත්- අමාරුවේ; අගමැතිත් අමාරුවේ; ආණ්ඩුවත් අමාරුවේ. මම කියන්නම්, ඒ තුන මොනවාද කියලා.

ඉතිරි ධර්ම තුනේ තිබෙනවා, උට්ඨාන සම්පදා - උත්සාහ සම්පත්තිය, ආරක්ඛ සම්පදා-ආරක්ෂා සම්පත්තිය, කල්‍යාණ මිත්තා- යහපත් මිතුරන් ඇති බව. එතුමා ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සමජීවිකතා ගැන කථා කරලා ඉතිරි කාරණා තුන ගැන කථා කළේ නැහැ. ඒ ගැන කථා නොකළේ ඇයි? වංචා හා දූෂණ සිදු කරන ආණ්ඩුවේ සාමාජිකයන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමේදී, ජනතාවට පෙන්වා දිය යුතු ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් උට්ඨාන සම්පදා ධර්මය ගැන කථා කරන්න බැහැ. උත්සාහය ගැන කථා කරන්න බැහැ. ඒ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

රකින හින්දා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පත් වුණු නිසා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

යැපෙන නිසා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඔක්සිජන් ලබා ගැනීම නිසා.

බාල ඖෂධ ගෙන්වීමෙන් මෙන්ම, රාජ්‍ය පාලනයේ දුර්වලතා හේතුවෙනුත් ජනතාව ජීවිතක්ෂයට පත් වුණා. එවන් තත්ත්වයක් තුළ ආරක්ඛ සම්පදා ගැන කථා කරන්න පුළුවන්ද? ආරක්ෂාව ගැන කථා කරන්න පුළුවන්ද? අර නොකිව්ව ඉතිරි ධර්ම තුනෙන් දෙවැනි එක වන ආරක්ෂාව ගැන කථා කරන්න බැහැ. ඇයි? හොරකම, වංචාව, දූෂණය, මංකොල්ලකෑම පදනම් කරගෙන රාජ්‍ය පාලනය ක්‍රියාත්මක වෙනකොට ආරක්ෂාව ගැන කථා කරන්න බැහැ නේ. ඒක නිසා ජනාධිපතිවරයා -මුදල් ඇමතිවරයා- ඒ ගැන සඳහන් කළේ නැහැ.

සඳහන් නොකරපු තුන්වැනි ධර්මය මොකක්ද? ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වෙනවා, කල්‍යාණ මිත්‍ර ධර්මය ගැන. ජනාධිපති ඇතුළු ආණ්ඩුවම ජනතාව ප්‍රතික්ෂේප කරලා තිබෙන මොහොතක කල්‍යාණ මිත්‍රකම බිඳ හෙළලා හමාරයි නේ. ජන වරමක් නැහැ නේ. කලණ මිතුරන් නැහැ නේ. ලක්ෂ 220ම අනාථ කරලා හමාරයි නේ. එවන් තත්ත්වයක් තුළ කොහොමද කල්‍යාණ මිත්ත ගැන කථා කරන්නේ? ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා අන්දලා සූත්‍රයක එක වදනක් විතරක් දීලා, ඉතුරු තුන අමතක කරලා කථාව කරන්න කියලා මේ දිරච්ච ලණු දෙන්නේ කවුද දන්නේ නැහැ.

මම හිතන්නේ කවුරුවත් ලියා දුන්නු එකක් කියවනවාට වැඩිය හොඳයි, ඒ ගැන කියවලා අවබෝධයක් ලබාගෙන කටයුතු කරනවා නම්. විශේෂයෙන්ම ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ගැන මොනවා හරි තව අමතර දේවල් දැනගන්න ඕනෑ නම්, ඕනෑම වෙලාවක නොමිලේ උපදෙස් දෙන්න මම ලෑස්තියි කියන එකත් මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මේ අය වැය ලේඛනය ගැන ගරු අගමැතිතුමා බොහොම ලස්සනට කථා කළා. ඔබතුමා කිව්වා, මේක අපේ විශ්වාසය තහවුරු වෙන අය වැයක් කියලා. ඔබතුමා එහෙම කිව්වේ නැහැයි කියන්න බැහැ. ඔබතුමා එහෙම කිව්වා. ජනාධිපතිතුමා මීට පෙර ජනාධිපති හැටියට කියපු කථා ක්‍රියාත්මක නොකර මේ අය වැය කථාවේ නැවත ඒවා කියනවා. එතකොට කොහොමද විශ්වාසය තහවුරු වෙන්නේ?

බලන්න, 2022 අගෝස්තු මාසයේ 03වැනි දා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව අමතා කියනවා, "රජයේ තට්ටු නිවාසවල ජීවත්

වන අයට නිවාස අයිතිය ලබා දෙනවා" කියලා. කවදාද කියන්නේ? 2022 අගෝස්තු මාසයේ 03වැනි දා. එදා එහෙම කියලා දැන් ඒකම ආපහු කියනවා. 2023 ජනවාරි මාසයේ 17වැනි දින මොකක්ද කිව්වේ? "කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස 1,996ක් ඉදිකර ඒ අයට නොමිලේ දෙනවා" කියලා. ඒ කවදාද කියන්නේ? මේ අවුරුද්දේ ජනවාරි මාසයේ. ඒ සඳහා රුපියල් බිලියන 10කුත් වෙන් කරනවා කියනවා. එදා එහෙම කියලා ආපහු කියනවා, "නාගරික වැඩසටහන් යටතේ ඉදිකරන ලද නිවාසවල පූර්ණ අයිතිය එම පවුල්වලට ලබා දීමට කටයුතු කරනවා" කියලා. මම කියන්නේ වැඩේ කෙරෙනවා නම් හොඳයි. රබන් ගහන්න ඉස්සෙල්ලා, කිරි බත් කන්න ඉස්සෙල්ලා, ජයඝෝෂා නංවන්න ඉස්සෙල්ලා ජනාධිපතිතුමා කලින් කියපු කථා ටික ක්‍රියාත්මක කරලා තිබෙනවාද, නැද්ද කියන එක ගැන ආණ්ඩු පාර්ශ්වය වාගේම රටේ ජනතාවත් හොයා බැලුවොත් හොඳයි. මොකද, 2019 ජනාධිපතිවරණය දිනලාත් කිරි බත් කෑවා; රබන් ගැහුවා; හොඳට නැටුවා. අවසානයේ රට බංකොලොත් වුණා.

ගරු කථානායකතුමනි, 2022 අගෝස්තු 03වැනි දා ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිත් කියනවා, "කඳුකරයේ දමිළ ජනතාවගේ ගැටලු විසඳීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා" කියලා. නමුත් ඒවා ක්‍රියාත්මක කෙරුණේ නැහැ. ඒක නැවත මේ අය වැය කථාවට දමනවා, "වතුකරයේ ජීවත් වන ජනතාවට නිවාස තනා දීම සඳහා ඉඩම් අයිතිය ලබා දෙනවා" කියලා. මොන විහිළුවක්ද? මීට වසරකට වැඩි කාලයකට පෙර කියපු දේ කෙරිලා නැහැ.

එතැනින් නතර වෙන්නේ නැහැ. ආපහු 2022 අගෝස්තු 03වැනි දා කියනවා, "උතුරේ විසඳිය යුතු ඉඩම් ප්‍රශ්න ඇතුළු සංවර්ධන කාර්යයන් පිළිබඳව අලුතින් සිතා බලා කටයුතු කරනවා" කියලා. නමුත් මොනවත් කරලා නැහැ. මෙවර කියනවා, "උතුරු නැගෙනහිර අවතැන් වූ ජනතාව සඳහා නිවාස සහ අත්‍යවශ්‍ය සහන ලබා දෙනවා" කියලා. ගරු කථානායකතුමනි, ඒකට ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, යමෙකුගේ දක්ෂතාව බලන්න, you have to check whether he can walk the talk; කියන දේ කරනවාද, කථාව ක්‍රියාවට පරිවර්තනය වෙනවාද කියලා බලන්න ඕනෑලු. ඒක මෙතැනදී සිදු වෙලා නැහැ. සාක්ෂි සහිතව මම මේ කියන්නේ. මීට අදාළ සියලු ලේඛන මම සභාගත කරන්නම්.

මහ ලේකම්තුමියනි, මෑත කාලයේදී මම හැන්සාඩ්ගත කරනවා, සභාගත කරනවා කිව්වාට මගෙන් ඒ පත්‍රිකා මොනවත් ගන්නේ නැහැ. මම දන්නේ නැහැ, ඒකත් මොකක් හරි අලුත් තීන්දුවක්ද කියලා. ඔබතුමිය පොඩ්ඩක් ඒ ගැන බලන්න.

දේශගුණික විපර්යාස සඳහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට රුපියල් මිලියන 100ක් වෙන් කරනවා කියලා 2022 නොවැම්බර් 14වැනි දින කියලා තිබෙනවා. නමුත් මොකුත් වෙලා නැහැ. මෙවරත් අය වැයට ඒ යෝජනාව දාලා තිබෙනවා, ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට කටයුතු කරනවා කියලා.

ඊයේ මන්ත්‍රීවරයෙක් ඇවිත් මම බොරුවක් කිව්වා කියලා කිව්වා. මම මේ ආණ්ඩුවෙන් අහනවා, 2022 නොවැම්බර් 14 වැනි දා වෙන් කරපු රුපියල් මිලියන 100න් එක රුපියලක්වත් වියදම් කරලා තිබෙනවාද කියලා. ඒ නිසා බොරුවට එක් එක්කෙනාගේ කුලී හේවායන් බවට පත් වෙලා මේක ඇතුළට ඇවිල්ලා බොරු දොඩවන්න එපා කියලා මම රාජ්‍ය පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා.

ජාතික ඵලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවනවා කියලා රුපියල් මිලියන 100ක් වෙන් කළා, 2022.11.14 වැනි දා අය වැය කථාවෙන්.

මොනවත් වෙලා නැහැ. ආපහු මෙවර අය වැයට ඇතුළත් කරනවා, "ජාතික ඵලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 150ක් වෙන් කරනවා" කියලා. එදා රුපියල් මිලියන 100ක් වෙන් කරලා වැඩේ නොකර තවත් රුපියල් මිලියන 150ක් වෙන් කරලා ආපහු වැඩේ කරනවා කියනවා. කාවද මේ රවට්ටන්න හදන්නේ? මේක ලොකු විහිළුවක් නේ. මේ රටේ ඉන්න ලක්ෂ 220 මෝඩයෝ කොට්ඨාසයක් කියලා හිතලා තමයි මේ අය වැය කථාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. 2022 නොවැම්බර් 14වැනි දා කියනවා, "මිරිදිය ධීවර කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීමට රුපියල් මිලියන 100ක් වෙන් කරනවා" කියලා. ධීවර ඇමතිවරයාත් දැන් ඉන්නවා මම ඉස්සරහා. ඒ මොනවත් කළේ නැහැ. මොනවත් නොකර මෙවර අය වැයට ඇතුළත් කරනවා, "මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා රුපියල් මිලියන 200ක් වෙන් කරනවා" කියලා. 2022 නොවැම්බර් 14 කියනවා, "විදේශ රැකියා අවස්ථා සඳහා තරුණ තරුණියන් පුහුණු කිරීම සඳහා, 2023 වසරේ දී ජාතික තරුණ සේවා සභාව වෙත රුපියල් මිලියන 50ක් වෙන් කරනවා" කියලා. ඒක නොකර මෙවර අය වැයෙන් කියනවා, "තරුණ ප්‍රජාවට විදේශ රැකියා ලබා ගැනීමට අවශ්‍ය පුහුණු පාඨමාලා නවීකරණ කටයුතු උදෙසා ශ්‍රී ලංකා පදනමට රුපියල් මිලියන 150ක් වෙන් කරනවා" කියලා. මොන බොරුවක්ද මේ කරන්නේ? මේ මොන රැවටිල්ලක්ද?

ඊළඟට, 2023 පෙබරවාරි 08වැනි දා පාර්ලිමේන්තුව අමතමින් එතුමා කියනවා, "කෘෂි කාර්මික කටයුතු නවීකරණය සඳහා අවශ්‍ය තාක්ෂණය සහ පහසුකම් සලසා දෙනවා" කියලා. ඒ සඳහා අංශු මාත්‍රයක දෙයක් කරන්නේ නැහැ. මෙවර අය වැය ඉදිරිපත් කරමින් කියනවා, "වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂි කාර්මික කේන්ද්‍රස්ථාන ලෙස වැඩිදියුණු කිරීමට රුපියල් මිලියන 2,500ක් වෙන් කරනවා" කියලා. එසේ මෙසේ ගණනක් නොවෙයි, රුපියල් බිලියන 2.5ක්. මේ කාවද රවට්ටන්නේ? මේවා ඇස් බැන්දුම් කථා නේ; රැවටිලි කථා නේ. මේක ආපහු 2019 ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කරපු ඇන්දවීම නේ; ජනතාව ඇන්දවීම.

ඊළඟට, 2023 ජනවාරි 17වැනි දා කියනවා, "ස්ත්‍රී පුරුෂ සමානාත්මතා පනත සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ගේනවා" කියලා. වෙන කොහේවත් නොවෙයි ජනාධිපතිතුමා ඒක කියන්නේ, මේ පාර්ලිමේන්තුවේ. එතුමා ඒ ප්‍රකාශ කරපු කාරණා සියල්ල සඳහන් ලේඛන මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, අලුත් නීති ගෙනෙනවා කිව්වාට මොනවත් කරලා නැහැ. එහෙම නොකර මෙවර අය වැයෙන් කියනවා, "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ නීති සම්පාදනය කිරීමට සහ කාන්තාවන් සවිබල ගැන්වීමට නීති හඳුන්වා දීමට කටයුතු කරනවා" කියලා. - *[බාධා කිරීමක්]* I never disturbed you, Hon. Prime Minister; ගරු අග්‍රාමාත්‍යතුමනි, මම ඔබතුමාට බාධා කළේ නැහැ. මට අවස්ථාව දෙන්න. මම මේ කියන්නේ, කියපු එක දෙයක්වත් කරලා නැති බව.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Prime Minister හැටියට මම මේ ප්‍රකාශය කරන්නේ. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත, කොමිසම අනුමත කරලා දැන් යවලා තිබෙනවා, Legal Draftsman වෙත. It will be submitted to Parliament before long.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, එතුමා අගමැති හැටියට ඒකට ඉදිරිපත් වනවා කියපු එක ඉතා වැදගත්. මොකද, ජනාධිපතිට ඕනෑ වෙලාවක පුළුවන් අගමැති ඉවත් කරන්න. ඒකට බයේ තමයි මේ නැඟිටලා එක එක දේවල් කියන්නේ. බොහොම වැදගත්, අගමැති හැටියට කථා කරපු එක බොහොම වැදගත්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා ඉවත් කර ගන්න ඕනෑ වෙලාවක, ඕනෑ කෙනෙකුට පුළුවන්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, මෙතුමා දුන්නු දේත් භාර ගත්තේ නැහැ. මේ වාගේම කථාවක් කිව්වා, මෙතුමාගේ ආදරණීය පියා මෙතැන ඉඳගෙන ඉන්නකොට. එතුමාට කිව්වා, "වැඩක් නැති, කිසිම දෙයක් නොකරන අගමැති" කියලා. ඒකට දුන්නු උත්තරය හැන්සාඩ් වාර්තාවේ බලන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට දැන් තේරෙනවා, මේ අගමැතිත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ වෙලා ඉන්නේ කියලා. ඒක තමයි මගේ තාත්තා ගැන සඳහන් කළේ. අගමැතිතුමා, යන්න එපා ඉන්න. ඉන්න, මගේ උත්තර අහ ගන්න.

ගරු කථානායකතුමනි, මගේ කථාවට disturb කරන්න ඉඩ දෙන්න එපා. ඒක සදාචාර සම්පන්න නැහැ නේ. අගමැතිතුමා කථා කරනකොට අපි කවුරුවත් disturb කළේ නැහැ නේ. ඒක නිසා කරුණාකරලා disturb කරන්න එපා. මම විශේෂයෙන්ම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, පැහැදිලිවම අගමැති කියන තනතුර ඇත්තටම බල රහිත වෙන්න පුළුවන් බව. අගමැතිවරයාගේ දක්ෂතාව මත තමයි ඒක බල සහිත කර ගන්නේ. ඉතින්, අපි හැමෝම දන්නවා, දැන් ඉන්න අගමැතිවරයා තමයි එදා විපක්ෂයේ ඉන්නකොට රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කිව්වේ, "බැංකු හොරා. බැංකු හොරා. බැංකු හොරා" කියලා. එක වෙලාවක අංශක 180ක් කැරකි කැරකී කිව්වා, ඊට පස්සේ ගරු කථානායකතුමනි, අංශක 360ම කැරකිලා කිව්වා. කැරකි කැරකී කිව්වේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් ජනාධිපතිවරයාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තැනට ඇවිල්ලා තිබෙනවා. කමක් නැහැ. දැන් අගමැති සභාවේ නැහැ, මට උත්තර දෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මම කියනවා පුළුවන් නම් ජනාධිපතිටයි, අගමැතිටයි එන්න කියලා මේ කථාව අහගෙන ඉන්න.

ගරු කථානායකතුමනි, මා කියාගෙන ආපු කරුණුවලට අදාළ සියලු ලේඛන සියලුදෙනාගේම දැන ගැනීම උදෙසා සභාගත කරන්නම්. දැන් බලන්න, කරනවා කියපු එක දෙයක්වත් කරලා නැහැ. සමා වෙන්න, එක දෙයක්වත් කියන එක වැරදියි. කොටසක් කරලා තිබෙනවා, ඉතාම සුළු කොටසක්. නොකළ දේවල් ටික මම සභාගත කළා.

මෙවර අය වැය කථාවේ trend එකක් තිබෙනවා. මොකක්ද ඒ trend එක? ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ කොටස් හතරෙන් එක කොටසක් විතරක් ඉදිරිපත් කරලා කොටස් තුනක්ම අමතක කරලා කථා කළා සේම, මීට පෙර අය වැයේ පොරොන්දු වුණු දේවල් කිසිවක් ක්‍රියාත්මක කරන්නට ජනාධිපතිවරයාවත්, ආණ්ඩුවවත් පොහොසත් වෙලා නැහැ.

ගරු කථානායකතුමනි, හැම වෙලාවේම evaluation කියන එක හරි වැදගත් ප්‍රතිපත්ති සම්පාදනයේදී, policy-making process එකේදී. ප්‍රතිපත්ති නිර්මාණය කිරීම -policy formulation, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම -policy implementation, ඊට පස්සේ එනවා evaluation, monitoring and feedback. ඒක ආපහු යනවා policy input කියන තැනට. ඒ ප්‍රතිපත්ති චක්‍රය. මේ ආණ්ඩුව ප්‍රතිපත්ති චක්‍රයක් දන්නේ නැහැ.

විපක්ෂ නායක කාර්යාලයේ පර්යේෂණ ඒකකය 2023 වසර වෙනුවෙන් 2022දී ඉදිරිපත් කළ අය වැය කථාවේ යෝජනා 77ක් පරිශීලනය කරලා තීන්දු කර තිබෙනවා, ඒ 77න්, 69ක් කඩ වුණු පොරොන්දු ගණයට දාන්න. ඇයි? ව්‍යාපෘති 69න් 16ක් -සියයට 23ක්- පටන් අරගෙනවත් නැහැ. ඒ වාගේම ව්‍යාපෘති 69න් 29ක -සියයට 42ක- සියයට 50කට අඩු ප්‍රගතියක් තිබෙන්නේ. ඒ වාගේම ව්‍යාපෘති 12ක -ඒ කියන්නේ මුළු ව්‍යාපෘති ප්‍රමාණයෙන් සියයට 17ක- පමණයි සියයට 50කට වැඩි ප්‍රගතිය තිබෙන්නේ. ඒ වාගේම ව්‍යාපෘති 12ක් ගැන කිසිම තොරතුරක් නැහැ, undisclosed.

ගරු කථානායකතුමනි, දැන් මම ඒ ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් මතු කළා. ප්‍රශ්නය මතු කළාට පසුව මට ආරංචියි, ජනාධිපති ලේකම් කාර්යාලයේයි, මුදල් අමාත්‍යාංශයේයි, මහා භාණ්ඩාගාරයේයි හැමෝම වටේ දුවනවාලු, මේ ක්‍රියාත්මක නොකළ, මඳ වශයෙන්, අඩු වශයෙන්, භාගයක් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 69 මොනවාද කියලා හොය හොයා. මහ ලොකුවට, කයිවාරුවට කියන්නේ කාර්යක්ෂම රාජ්‍ය පාලනය කියලා. දැන් හොඳ මුදල් රාජ්‍ය ඇමතිවරයෙක් ලැබිලා තිබෙනවා, එතුමා දන්නවා හොඳ වචන හරඹයක නියැලෙන්න. එතුමා කියනවා, "මම පොඩ්ඩක් මේ වෙලාවේ උත්තර දෙන්නම්, ප්‍රශ්නය වැදගත් නිසා. පසුව වැඩිදුර පිළිතුරු සපයන්නම්" කියලා.

ගරු කථානායකතුමනි, 2024 අය වැය ගැන කථා කරන්න කලින් මේ හැම තොරතුරක්ම මුදල් ඇමතිවරයා සතුව තිබෙන්න ඕනෑ. මේ තොරතුරු කරුණු කාරණා අතේ තියාගෙන තමයි අය වැය කථාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. නමුත් කිසිම පරිශීලනයක් නැතිව, ගිය වසරේ ප්‍රගතිය අංශු මාත්‍රයකටවත් ගණන් ගන්නේ නැතිව මේ ඉදිරිපත් කළේ සත්‍ය වශයෙන්ම සිල්ලර අය වැය කථාවක් කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ තොරතුරු සියල්ලක්ම මම සභාගත කරන්නම්. හැබැයි, මම රජයට අභියෝග කරනවා මේ Proposals 77න් ක්‍රියාත්මක නොකළ, අඩ වශයෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 69 පුළුවන් නම් ඔබතුමන්ලාම සොයා ගන්න කියලා. ඒකටත් හැකියාවක් නැහැ. දැන් පිස්සෝ වාගේ

දුවනවාලු, ලෝකය වටේ. ඒකයි ඇත්ත කථාව. ඊට පස්සේ මම මේ තොරතුරු සභාගත කරන්නම්. විශේෂයෙන්ම අපටත් දැනගන්න ඕනෑ වර්තමාන රජයේ කයිවාරුව වාගේ වැඩත් තිබෙනවාද කියලා.

ඉරාන් වික්‍රමරත්න මැතිතුමා මේ අය වැය ඩිස්නිලන්තයේ සංචාරයකට උපමා කළා. මම එකඟයි ඒකට. ඒ වාගේම හර්ෂ ද සිල්වා මැතිතුමා ප්‍රකාශ කළා මේක "oxymoron" අය වැයක් කියලා.

ඒ කියන්නේ, contradictory අය වැයක් කියලා. මම කියනවා, මේ අය වැය "Voodoo economics"වලින් පිරිච්ච අය වැයක් කියලා. Voodoo ආර්ථික ප්‍රතිපත්ති තමයි මේ අය වැයේ තිබෙන්නේ. සාමාන්‍යයෙන් "Voodoo economics" කියන්නේ, taxes අඩු කරලා රාජ්‍ය වියදම වැඩි කිරීම. ඔය Voodoo economics කියන්නේ, ඒ කාලයේ ඇමෙරිකාවේ රිපබ්ලිකන් පක්ෂයේ ප්‍රාථමික තරගයේදී President George Bush එවකට අපේක්ෂක රේගන්ගේ ආර්ථික ප්‍රතිපත්තියට කියාපු දේ. හැබැයි, ලංකාවට ආවේණික වූ Voodoo economics තිබෙනවා, මේ අය වැය ඇතුළේ. ඇයි මම එහෙම කියන්නේ? ගරු කථානායකතුමනි, මේ අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමට ආදායමක් ඕනෑ. කොහෙන්ද ඒ ආදායම? ඒ ආදායම ලබා ගැනීම පැත්තෙන් කිසිම සාර්ථකත්වයක් මේ රජයට නැහැ. ඒක ඔප්පු කර තිබෙනවා. IMF එකේ දෙවැනි වාරිකය ඇමෙරිකානු ඩොලර් මිලියන 333ක් ලැබෙන්නේ නැති ප්‍රධාන හේතුවක් තමයි, State revenue shortfall එක. රාජ්‍ය ආදායම් ඉලක්ක සම්පූර්ණ කරගන්න බැරි වෙලා තිබෙනවා. සියයට 15ක shortfall එකක් තිබෙනවා. ආදායම් උත්පාදනය කරන්නට මේ ආණ්ඩුවට බැහැ. හැබැයි එහෙම කර කර, අසාර්ථක බදු සූත්‍රයක් මේ රජය ක්‍රියාත්මක කරනවා. ඇයි ඒක අසාර්ථකයි කියන්නේ?

දැන් බලන්න, අර APIT එක, PAYE Tax එක පිළිබඳව. එය මේ රටේ professionalsලාගේ, lecturersලාගේ, ආචාර්ය මහාචාර්යවරුන්ගේ, engineersලාගේ, වෘත්තිකයන්ගේ, වෛද්‍යවරුන්ගේ ඇඟ පිට පටවලා තිබෙනවා. ඒ ඉලක්කය බිලියන 100යි. හැබැයි සියඹලාපිටිය රාජ්‍ය ඇමතිවරයාගෙන් මම අහපු ප්‍රශ්නයකදී එතුමා කියනවා, දැන් බිලියන 100 පන්නලා බිලියන 107ක් තිබෙනවා ලු. එතුමාම උපකල්පනය කරනවා, දෙසැම්බර් 31වැනි දා වෙනකොට APIT එකෙන් බිලියන 150ක් ලැබෙනවා කියලා. හැබැයි, ඉලක්කය බිලියන 100යි. ඒකෙන් මොකක්ද අපට හැඟෙන්නේ? ඒ තමයි බදු සූත්‍රයේ අසාර්ථකත්වය. වෙලා තිබෙන්නේ මොකක්ද? මේ රටේ වෘත්තිකයන්ගේ කර පිට, හිස මත අනවශ්‍ය ලෙස බදු බර පැටවීම නිසා අද brain drain ශීඝ්‍රගාමීව ක්‍රියාත්මක වෙනවා. සේමසිංහ මැතිතුමා නොදන්නවා නම්, ඔය ළඟම වාඩිවෙලා සිටින වෛද්‍යතුමියගෙන් අහන්න, දොස්තරවරු කොච්චර ප්‍රමාණයක් මේ රට අතහැර ගිහින් තිබෙනවා ද, විශේෂඥ වෛද්‍යවරු කොච්චර ප්‍රමාණයක් මේ රට අතහැර ගිහින් තිබෙනවා ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ අනිකුත් වෘත්තිකයන් කොච්චර ප්‍රමාණයක් මේ රට අතහැර ගිහින් තිබෙනවා ද කියලා. ඒ ක්ෂේත්‍රය ගැන පමණක් තොරතුරු විමසා බලන්න. ඒ අය over tax කරලා තිබෙන්නේ.

මම අහුවා over tax කළා නම්, අර වැඩිපුර tax කරපු බිලියන 50 ආපහු දෙනවාද කියලා. ඒකටත් උත්තරයක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ රජයේ ආදායම් උත්පාදනය ගැන කථා කරනකොට, Inland Revenue Department එකේ, Excise Department එකේ, Sri Lanka Customs එකේ බදු පරිපාලනය - tax administration - ගැන වැඩි අවධානයක් යොමු කර නැති බව පෙනී යනවා. බොරුවට අය වැය කථාවේ ඒවා දාලා තිබෙනවා. හැබැයි, ක්‍රියාත්මක වීමක් නැහැ. Digitization අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. බදු පරිපාලනය වඩා කාර්යක්ෂම වෙන්න ඕනෑ. බදු වැඩි කිරීමේදී හැමදාම බදු ගෙවන කොට්ඨාසයේ හිස මතම පටවන්නේ නැතුව, බදු පැහැර හරින - tax evade කරන - කණ්ඩායම බදු දැලට හසුකර ගන්නට ඕනෑ. අපි බය නැහැ මේවා කියන්න. මොකද, මේකයි ඇත්ත. මේක තිත්ත ඇත්ත. බදු සහන ලබා දීමේදී මීට වඩා රටට ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට, return එකක් ලැබෙන ආකාරයට බදු සහන - tax exemptions - ලබා දීම ක්‍රියාත්මක කරන්න ඕනෑ.

අභවල් විදේශ කොම්පැනියට ඇයි බදු සහන ලබා දුන්නේ කියලා පසුගිය දවසක පාර්ලිමේන්තුවේ මූල්‍ය කමිටුවකදී නිලධාරියකුගෙන් ප්‍රශ්න කරනකොට, ඒ නිලධාරියා කියනවා, "අපට දින කිහිපයක් කල් දෙන්න. ආයෝජකයාගෙන් අහලා කියන්නම්" කියලා. රටට ප්‍රතිලාභ වශයෙන් ලැබෙන්නේ මොනවාද කියලා අහනකොට ඒ නිලධාරියා දුන්නු උත්තරය ඔන්න ඕකයි. ඒ නිසා යථාර්ථවාදී නොවන ආකාරයේ බදු පරිපාලනයක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා රාජ්‍ය ආදායම් ලබා ගැනීමට මේ ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ආණ්ඩුවට economics තේරෙන්නේ නැහැ; ආර්ථික විද්‍යාව ගැන නම් දැනුමක් නැහැ. ආර්ථික සංකෝචනය - economic contraction - තමයි දැන් රජයේ ප්‍රතිපත්තිය; economic growth නොවෙයි. ඔබතුමන්ලා කියනවා, ස්ථායීකරණය -stabilization- සඳහා ආර්ථිකය තෙරපන්න ඕනෑ, ජන ජීවිත කුඩා කරන්න ඕනෑ කියලා. ඒක තමයි බදු පිට බදු ගහලා තිබෙන්නේ. මට කියන්න, contracting economy එකක, සංකෝචනය වන, කුඩා වන ආර්ථිකයක බදු ගහලා බදු ආදායම වැඩි කරගන්නේ කොහොමද කියලා? එහෙම බැරි බව පෙර පාසල් දරුවෙකුට වුණත් තේරෙන දෙයක් නේ. In an expansive economy, you can tax and earn revenue; ප්‍රසාරණය වන, වර්ධනය වන ආර්ථිකයක නම් බදු වැඩි කරලා බදු ආදායම වැඩි කර ගන්න පුළුවන්. මේ ගොල්ලන් කියනවා, ආර්ථිකය කුඩා කරලා, කුඩා වන ආර්ථිකයක බදු බර වැඩි කරලා, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නවා කියලා. මේ සුළු fundamental - ප්‍රාථමික - economic principle එක ඔබතුමන්ලා දන්නේ නැහැ.

මම දැක්කා කට්ටියක් රබන් ගහනවා, කට්ටියක් කිරිබත් කනවා, අර පොරොන්දුව දුන්නා, මේ පොරොන්දුව දුන්නා කියලා. මට පොඞ්ඩක් උත්තර දෙන්නකෝ. වැඩිහිටියන් සඳහා වන දීමනාව, ආබාධිත පුද්ගලයන් සඳහා වන දීමනාව, වකුගඩු රෝගීන් සඳහා වන දීමනාව අවසන් වරට දීලා තිබෙන්නේ අගෝස්තු මාසයේ. කෝ, සැප්තැම්බර් දීමනාව, කෝ ඔක්තෝබර් දීමනාව, කෝ නොවැම්බර් දීමනාව? මම මේ කියන්නේ වැඩිහිටියන්, ආබාධිත වූවන්, වකුගඩු රොගීන් සඳහා වන දීමනා ගැනයි. මේ දීමනා තුන දෙන්න බැරි රජයකට පුළුවන්ද, මේ අය වැයේ පොරොන්දු ඉෂ්ට කරන්න? ඇයි මෙහෙම රට රවටන්නේ? ඇයි මෙහෙම ජනතාව රවටන්නේ?

මම විශේෂයෙන් මුදල් ඇමතිවරයාට කියන්න කැමැතියි, කරුණාකර මේ බදු ප්‍රතිපත්ති පිළිබඳව තිබෙන විවිධ න්‍යායන් study කරන්න කියලා. Laffer Curve න්‍යාය තිබෙනවා. තවත් න්‍යාය ගණනාවක් තිබෙනවා. Income Elasticity of Demand and Supply බලන්න. ඔන්න ඔය න්‍යායන් පිළිබඳව අවබෝධයක් ලබාගන්න. ඔය විශේෂඥයන් යැයි කියන නිලධාරින් අය වැය කථාව ලියා දුන්නාම, ඉවක් බවක් නැතිව කියවන ඒ සුපුරුදු ක්‍රියාවලියෙන් කරුණාකර බැහැර වෙන්න කියන ඉල්ලීම මම කරනවා.

මෙවර අය වැය තුළ අපනයන ප්‍රවර්ධනයට - export promotion සඳහා, export developmentsවලට මොකවත් නැහැ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

Foreign direct investments ගැන මොකවත් නැහැ. අපි ඇත්තම කථා කරනවා නම්, ඒ කාලයේ - මම මේ කියන්නේ බංකොලොත්භාවයට පෙර - 6 to 7 per cent economic growth level එක තබාගෙන යන්න සියයට 30ක foreign direct investment rate එකක් අවශ්‍ය වුණා. මේවා ගැන කිසිම සඳහනක් නැහැ. මේවා ගැන කිසිම වැඩ පිළිවෙළක් නැහැ. බොහොම කනගාටුදායකයි. ආර්ථිකය වර්ධනය කරන ආකාරය - growth strategy එක - සම්බන්ධ කිසිම වැඩ පිළිවෙළක් නැහැ. කර්මාන්ත ප්‍රතිපත්තියක් නැහැ. දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන අනාගෙන තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ලෝක බැංකුවෙන්ද කොහෙන්ද ලැබුණු ඩොලර් මිලියන 200ක් කොහොම හරි ලක්ෂ 20කට බෙදා දෙන, අවිද්‍යාත්මක, දත්ත මත පදනම් නොවුණු, සාක්ෂි මත පදනම් නොවුණු, තහවුරු කරන්න බැරි වැඩසටහනක් "අස්වැසුම" නමින් ක්‍රියාත්මක කරනවා. මගේ මතකයේ හැටියට ප්‍රතිලාභීන්ගෙන් කොටසකට රුපියල් 15,000ක් දෙනවා, කොටසකට රුපියල් 8,500ක් දෙනවා, කොටසකට රුපියල් 5,000ක් දෙනවා, කොටසකට රුපියල් 2,500ක් දෙනවා. ඒක කරන්න ඉස්සෙල්ලා මේ ජනාධිපතිතුමාට තිබුණා බලයට ආ හැටියේ census එකක් කරලා, ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය - household income and expenditure survey එකක් - කරලා දරිද්‍රතා රේඛාව හඳුනාගෙන දරිද්‍රතා රේඛාව මත ඉන්නේ කවුද, ඊට යටින් ඉන්නේ කවුද, ඊට උඩින් ඉන්නේ කවුද කියලා සොයා බලන්න. ඒ සංඛ්‍යා සොයාගෙන තමයි ඒ වැඩ පිළිවෙළ සඳහා සල්ලි ටික සොයාගන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළේ තිබෙන එකම හොඳ දේ තමයි direct financial transfer එක. මුදල direct යනවා ප්‍රතිලාභියාට. එකම හොඳ දේ අන්න ඒක, direct funds transfer එක විතරයි. හැබැයි, මේක දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් නොවෙයි. මේකේ නිෂ්පාදනය පිළිබඳ production component එකක් නැහැ. මේකේ ආයෝජනය පිළිබඳ investment component එකක් නැහැ.

මේකේ ඉතිරිකිරීමේ - savings - component එකක් නැහැ. ඇත්තටම දෙන හැම දෙයක්ම යන්නේ consumptionවලට. ඒ, high cost of living නිසා. ඉතින්, පරිභෝජනයෙන් විතරක් පුළුවන්ද, දුප්පත්කම තුරන් කරන්න? දුප්පත්කම තුරන් කිරීමේ විනිවිදභාවයෙන් යුක්ත වූ වැඩසටහන් ගැන අවබෝධයක් නැත්නම්, කරුණාකර "ජනසවිය" ක්‍රියාත්මක කරපු ආකාරය ගැන පොඩ්ඩක් සොයා බලන්න. එදා ඒ කටයුතු හරියටම ක්‍රියාත්මක වුණා.

ඒ වාගේම, ළමා සහ මාතෘ සෞඛ්‍යය ගැන කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ පිළිබඳ ඕනෑ තරම් වාර්තා තිබෙනවා; UNICEF වාර්තා, UNDP වාර්තා, UNFPA වාර්තා, World Food Programme වාර්තා, World Bank වාර්තා තිබෙනවා. නමුත්, මව්වරුන්ගේ සහ ළදරුවන්ගේ මන්දපෝෂණය ඉහළ මට්ටමකට ගිහින් තිබෙනවා. අපේ රටේ ජාතික පෝෂණ ප්‍රතිපත්තියක් නැහැ. අය වැය තුළ මව්වරුන්ගේ සහ දරුවන්ගේ පෝෂණ වැඩසටහන ගැන අංශු මාත්‍රයක දෙයක් සඳහන් වෙලා නැහැ.

ඒ වාගේම බුද්ධිගලනයට - brain drain එකට - කිසිම විසඳුමක් නැහැ; කිසිම වැඩ පිළිවෙළක් නැහැ. සඳහනක්වත් නැහැ, බුද්ධිගලනය නතර කරන්න ලබා දෙන යෝජනා ගැන. අනේ! අර ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය - micro, small and medium-sized enterprises - පිළිබඳ යෝජනාවලට ඇත්ත වශයෙන්ම support එකක් කියලා ලැබෙන්නේ ADB එකෙන් විතරයි. ඒකත් මේ දෙසැම්බර් මාසයේ ADB Board එකෙන් අනුමත වෙන්නට ඕනෑ. අපි ප්‍රාර්ථනා කරනවා ඒ US Dollars 100 million අනුමත වේවා කියලා. කොටින්ම කිව්වොත්, අය වැය කථාවේවත් සඳහන් වෙලා නැහැ, කොහොමද මේ US Dollars 100 million ක්‍රියාත්මක වෙන්නේ කියලා. ඒක විධි දෙකකට ක්‍රියාත්මක වෙනවා. එකක් තමයි, credit guarantee එකට දෙන එක. ඒ දෙන්නේ, collaterals නැති, ඇප සුරැකුම් නැති කණ්ඩායමට. අනෙක් එක, දේශීය බැංකු පද්ධතිය හරහා MSMEs සඳහා ණය ගැනීමේ පහසුකම් ලබා දීම. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් අපට කිව්වා, විශ්වාසය තිබෙන customersලාට - comfortable customersලාට - විතරක් එම ණය පහසුකම් ලබා දීමේ ප්‍රවණතාවක් සමහර බැංකුවල තිබෙනවා කියලා. එතකොට අර කියපු US Dollars 100 million ප්‍රතිලාභය සැබැවින් දුෂ්කරතාවට පත් වුණු අයට ලැබෙන්නේ නැහැ.

UNDP වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා, බහුමාන අවදානම්තාවලට - multidimensional vulnerabilitiesවලට - අපේ රටේ ප්‍රජාව මුහුණ දීලා තිබෙනවා කියා. මේ රටේ හැම 10දෙනෙකුගෙන් 6දෙනෙක්ම මේ කියන බහුමාන අවදානම්තාවට - multidimensional vulnerabilitiesවලට - ලක් වෙලා තිබෙනවා. මා එම තොරතුරු ඇතුළත් ලේඛනය ද, තවත් අදාළ ලේඛන කිහිපයක් ද **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, දැන් අපට කියනවා දත්ත කේන්ද්‍රීය - තොරතුරු කේන්ද්‍රීය - බොහොම උසස් අය වැයක් ඉදිරිපත් කළා කියලා. ඔබතුමා අදටත් දන්නවාද, 2020-2021 ගෘහයක ආදායම්-වියදම් සමීක්ෂණය කරලා තිබෙන බව. හැබැයි, ඒ දත්ත release කරන්නේ නැහැ. ඒවා හංගගෙන ඉන්නවා. ඒවා රටෙන් වසන් කරනවා; ජනතාවගෙන් හංගනවා. ඇයි, 2020-2021 වර්ෂවල ගෘහයක ආදායම් හා වියදම් සමීක්ෂණය රටට හෙළිදරව් කරන්නේ නැත්තේ ඇයි කියා මම අහන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මේ විවේචනත් සමඟ අපේ විසඳුම් ලබා දෙන්න මම කැමතියි. මොනවාද, අපේ විසඳුම්? පළමුවෙනි විසඳුම මේකයි. මේ රටේ Ease of Doing Business Index එක ඉහළ ප්‍රශස්ත මට්ටමක තබා ගන්න පුළුවන් Single Window platform එක, one-stop-shop ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මඟින්. ඒවා හැබැයි මේ කතාවේ නම් තිබෙනවා, ක්‍රියාවේ නැහැ. බොහොම සරලව කියන්නම්, ඇඟලුම් කම්හල් 200 වැඩසටහන රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ක්‍රියාත්මක කරපු ආකාරය. උදාහරණයක් වශයෙන් මම මෙය කියන්නේ. ජනවාරි මාසයේ මුල රැස්වීම කැඳෙව්වා, - සතිපතා රැස්වීම් පැවැත්වුණා, හැම සඳුදා දවසකම. ජනාධිපතිවරයා ආවා; diary එක open කළා. එක පැත්තක ඉන්නවා, ආයෝජකයන් පෝලිම. තවත් පැත්තක ඉන්නවා, නිලධාරින් පෝලිම. මාස තුනක්, හතරක් ඉදිරියට තියලා ජනාධිපතිවරයා ඇඟලුම් කර්මාන්තශාලාව විවෘත කරන දිනය දෙනවා. එතුමා විනාඩි 15යි, 20යි ගත කරන්නේ. ඊට පස්සේ diary එක වහ ගන්නවා; යනවා. මාස තුනක්, හතරක් ඇතුළත අදාළ දිනයට කර්මාන්තශාලාව නිසි පරිදි නිසි ආකාරයට පුද්ගලයන් 1,000කට, 1,500කට රැකීරක්ෂා සපයමින් විවෘත වෙනවා. එතකොට විවෘත කිරීමේ දිනය දුන්නාම අනෙක් හැම දේම ආපස්සට ගිහිල්ලා ඒ දිනය දක්වා හරියට ක්‍රියාත්මක වෙන්න ඕනෑ. යටිතල පහසුකම්, ඉඩම් වෙන් කිරීම ආදි සියල්ල.

ඒ කාලයේ නම් Multi-Fibre Agreement එක අනුව quotas ලබා දුන්නේ ඒ ප්‍රදේශවල දුෂ්කරතා අනුව. දැන් Multi-Fibre Agreement එකකුත් නැහැ, quota ක්‍රමයකුත් නැහැ. දැන් අපි හොඳට කාර්යක්ෂමව අපේ ඇඟලුම් නිෂ්පාදන ක්‍රියාවලිය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ක්‍රියාත්මක කරනවාද? අද සීමා නැහැ. එදා සීමා තිබුණා. අද one-stop-shop කියන එක, එහෙම නැත්නම් Single Window platform කියන එක අය වැය කථාවේ නම් තිබෙනවා, ක්‍රියාත්මක වෙන්නේ නැහැ, මෙතෙක් කල් ක්‍රියාත්මක වුණෙත් නැහැ. මේ රටේ ලක්ෂ ගණනක් විරැකියා පෝලිමේ - unemployment line එකේ - ඉන්නවා. විරැකියාවෙන් පෙළෙන අයට රැකියා ලැබෙන ක්‍රමයක් කමේ අය වැයේ කථා කරලා නැහැ.

අපනයන ප්‍රතිපත්ති වෙනුවෙන් අපි පෙනී සිටිනවා. අපනයන ප්‍රවර්ධනය වෙනුවෙන් අපට ලබා දෙන්න පුළුවන් උත්තේජන සියල්ලේ export package එක අපි අද නිර්මාණය කරලා හමාරයි. ඉගෙන ගන්න, මාගුට් තැචර් ක්‍රියාත්මක කළා "Enterprise Zones" policy එකක්. ඇඟලුම් කම්හල් 200 වැඩසටහන පමණක් නොවෙයි, අපටත් පුළුවන් විවිධ රටවලට dedicated industrial zones අපේ රටේ හදන්න. චීනයට එකක්, ඉන්දියාවට එකක්, ජපානයට එකක් වශයෙන් dedicated industrial zones හදලා, ඒවාටම ආවේණික වුණු නීති සම්පාදනය කරන්න පුළුවන්. අපේ රජයක් තුළ එවන් රටවල් කේන්ද්‍රීය කර්මාන්ත කලාප වැඩසටහනකට යන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි ජාතික පෝෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවා, මව්වරුන් සහ ළදරුවන් වෙනුවෙන්. ඒ වාගේම අපි ආර්ථික වර්ධන strategy එකක් ක්‍රියාත්මක කරනවා. අපි විශ්වාස කරන්නේ නැහැ, ආර්ථික සංකෝචනය - economic contraction - ගැන. අපි කියන්නේ, මේ මහා බංකොලොත්භාවයෙන්, මර උගුලෙන් ගොඩ එන්නට නම් ආර්ථික වර්ධනය - economic growth - ක්‍රියාත්මක විය යුතු බවයි. ඒ වාගේම අපි ක්‍රියාත්මක කරන දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන - poverty alleviation strategy එක, විද්‍යාත්මක දත්ත කේන්ද්‍රීය, පරිභෝජනය, නිෂ්පාදනය, ආයෝජනය, ඉතිරි කිරීම යන කොටස් හතරම අඩංගු වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, stolen assets recover කරන වැඩසටහනකට අපි යන්නට ඕනෑ. මේ රටේ දූෂණය, වංචාව හොරකම නිසා දළ දේශීය නිෂ්පාදිතයට අහිමි වන අගය බොහොම ඉහළ තලයක තිබෙනවා. දැන් බලන්න රට වටේ, ලෝකෙ වටේ ගිහිල්ලා සමහරෙක් කියනවා, අපි පත් කරන්න, එතකොට අපි හොරු අල්ලන්නම් කියලා. අපි විපක්ෂයේ ඉඳගෙනම, අපේ දක්ෂ පක්ෂ, හපන්කම් තිබෙන සමගි නීතිඥ සංගමය උපයෝගි කරගෙන, සමගි බුද්ධි මණ්ඩපයේ සාමාජිකයන් තුන්දෙනෙකුගේ සහභාගිත්වයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළා. අද ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඒකෙන් නම් කරලා කියා තිබෙනවා, මේ රට බංකොලොත් කරපු කණ්ඩායම, මේ රට හොරා කාපු කණ්ඩායම මේකයි කියලා. එහෙම නම් ඊළඟ පියවර මොකක්ද? මේ රට බංකොලොත් කිරීම තුළින් ජන ජීවිත කඩා වැටුණු, ව්‍යාපාර කඩා වැටුණු සියලුදෙනාට අවස්ථාවක් තිබෙනවා රට බංකොලොත් කළ කණ්ඩායමෙන් ඒ අයට අහිමි වුණු මුදල් ටික නීති මාර්ගයෙන් ලබා ගන්න. අපි නීති ක්‍රියාමාර්ගය එතැනට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම සමහරෙක් කියනවා, ඒ අයගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්න ඕනෑය කියලා. මම හිතන විධියට ප්‍රජා අයිතිය අහෝසි කරන ක්‍රියාවලිය මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අණපනත් අනුගමනය කරමින් සිදු විය යුතු ක්‍රියාවලියක්. ඒක රටේ ජනතාවගේ ඉල්ලීම. ජනතාවයි කියන්නේ. රට බංකොලොත් කරපු අය කවුද කියලා දැන් උසාවිය නම් කරලා තිබෙනවා. ඒ අයට නැවත මේ රටේ ඡන්දය දීමේ අයිතිය, ඡන්දයකට ඉදිරිපත් වීමේ අයිතිය දෙන්න හොඳ නැහැ. එහෙම කියනවා, රටේ ලොකු ජන කොට්ඨාසයක්. හැබැයි ඒ අයට මම කියන්න කැමැතියි, Special Presidential Commissions of Inquiry Law, No. 7 of 1978 අනුව විශේෂ ජනාධිපති කොමිසමක් හරහා පැහැදිලිවම එය ක්‍රියාත්මක වෙන්න ඕනෑ බව. ඇත්ත වශයෙන්ම ප්‍රජා අයිතිය අහෝසි කිරීමේ - civic disability - ක්‍රියාවලියට මුල පුරන්න ඕනෑ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන ජනාධිපතිතුමා. ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ, නිවාඩ් කබ්රාල්, ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්, පී.බී. ජයසුන්දර, එස්.ආර්. ආටිගල, ඒ වාගේම Monetary Board එකේ දෙන්නෙක් හැරුණුකොට අනෙක් අය රට බංකොලොත් කළාය කියලා ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා. ඉතින් මම දන්නේ නැහැ, රට බංකොලොත් කරපු 134දෙනෙකුගේ වරමෙන් ජනාධිපති පුටුවට ආපු වර්තමාන ජනාධිපතිතුමාට, මේ රටේ අතිමහත් බහුතරයක් ඉල්ලන ප්‍රජා අයිතිය අහෝසි කිරීමේ වැඩ පිළිවෙළට ආරම්භයක් ලබා දෙන්න උවමනාවක් තිබෙයිද කියලා.

මොකද, එතුමාගේ අතේ තමයි ඒක තිබෙන්නේ. විශේෂයෙන්ම මේ රටේ අතිමහත් බහුතරයක් ප්‍රජා අයිතිය අහෝසි කරන්නය කියලා ඉල්ලන මොහොතක, මේ රටේ ආර්ථික ඝාතකයෝ කවුද කියන එක ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අද ඔප්පු කරලා හමාරයි. එදා නම් කිව්වේ, එක්කෙනෙක් ගැන විතරයි. ඒ පී.බී ජයසුන්දර කියලා. එක් කෙනෙක් නොවෙයි, රාජපක්ෂ පවුල් සංස්ථාව ප්‍රමුඛ ඒ මුළු කණ්ඩායම මේ රටේ ආර්ථික ඝාතකයෝය කියන එක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිගමනය කළේ වෙන කවුරුත් නිසා නොවෙයි. ඒ සමගි ජන බලවේගයට, සමගි ජන සන්ධානයට, සමගි ජන බලවේගයේ බුද්ධි මණ්ඩපයට, සමගි ජන බලවේගයේ නීතිඥ මණ්ඩලයට පිං සිද්ධ වෙන්නයි කියන කාරණය මම මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

මම අවසාන වශයෙන් අපේ හිතවත් ජනාධිපතිතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. එතුමා එදා බොහොම ලස්සනට වචන හරඹයක යෙදුණා. එතුමා කියනවා, "එන්න කෝ, එන්න කෝ, ඔයගොල්ලෝ දෙන්න කෝ සහයෝගය, ඔයගොල්ලෝ එක්ක සාකච්ඡා කරලා නේ කළේ" කියලා. මේ මොකක්ද මේ පෙන්වන්න හදන්නේ? මේ පෙන්වන්න හදන්නේ, සමගි ජන බලවේගයේ ඉන්නේ අති මහත් බහුතරයක් UNP එකේ හිටපු අය කියන එකයි. මේක තමයි රටට පෙන්වන්න හදන චිත්‍රය. "ඒ නිසා ඔය ගොල්ලොයි මමයි එකයි" කියන කාරණාව තමයි පෙන්වන්න හදන්නේ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා අනුගමනය කරන නව ලිබරල්වාදයේ ලුම්පන් ධනවාදය අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. අපි අනුගමනය කරන්නේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය, සමාජ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය සහ මානුෂීය ධනවාදය. ව්‍යවසායකත්වය තුළ, නිදහස් වෙළෙඳ පොළ බලවේග තුළ අපි නිර්මාණය කරනවා අපේ ධන සම්පත. අපේ wealth creating mechanism එක තමයි capitalism with a human face. හැබැයි, ධනවාදයේ ඌණතා සහ අඩුපාඩු රැසක් තිබෙනවා කියලා අපි දන්නවා. ඒ නිසා අපි සමානාත්මතාවය , යුක්තිය - justice - සහ සාධාරණත්වය - equity - නිර්මාණය කරන්න moral සහ ethical ආකාරයට social, democratic principles ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න පෙර මම නම් ගම් සඳහන් කරන්නේ නැතිව මේ රට යන අත ගැන කාරණාවක් කියන්න ඕනෑ. මේ රට යන අත ගැන හොඳට බලාගන්න පුළුවන්, රටේ ජනාධිපතිතුමා ළඟ ඉන්න අයගෙන්. ඒ අයට මේ රට යන අත ගැන විශ්වාසයක් තිබෙනවාද, නැද්ද? මම නම් ගම් කියන්නේ නැහැ. මගේ කථාව අවසන් කරමින් මම කියන්න කැමැතියි, එතුමා වෙනුවෙන් ඉන්න මාධ්‍ය කණ්ඩායම් එතුමාත් එක්ක රට ගිහිල්ලා ආපහු මේ රටට ඇවිල්ලා ඒ වීසා එක උපයෝගී කරගෙන රට අතහැර ගිහිල්ලා තිබෙනවා කියලා. මම ඒ අයගේ නම් ගම් කියන්න යන්නේ නැහැ. එතුමා ආවරණය කරන මාධ්‍ය කණ්ඩායම් කිහිපයක්,- කවුරු හරි අභියෝග කරනවා නම්, මම ඒ නම් ගම් කියන්නම්. කවුරු හරි අභියෝග කරනවාද? නැහැ, කවුරුවත් අභියෝග කරන්නේ නැහැ. ඒ නිසා මම ඒ නම්, ගම්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කියන්නේ නැහැ. මොකද, මම හිතනවා සදාචාරාත්මක විධියට නම් ගම් නොකියා ඉන්න ඕනෑ කියලා. ජනාධිපතිතුමා ළඟ ඉඳලා එතුමා ආවරණය කරපු මාධ්‍ය කණ්ඩායම්වල සිටින දෙතුන් දෙනෙක් රට අතහැර ගිහින් තිබෙනවා. ඒ ගොල්ලන්ටත් ජනාධිපතිතුමාගේ ඉදිරි ගමන ගැන විශ්වාසයක් නැත්නම් මේ රටේ ලක්ෂ 220කගේ විශ්වාසය ගැන මොන කථාද? මේ ප්‍රකාශයත් සමඟ මගේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් කරනවා.

මම ප්‍රාර්ථනා කරනවා, මීට වඩා ප්‍රබුද්ධවුත්, ප්‍රශස්තවුත් විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වුණු, දත්ත මත පදනම් වුණු අනාගත ගමනකට මුල පුරන්නට හැකියාව ලැබේවා කියලා. හැබැයි, මේ ජනාධිපතිතුමා වටේ ඉඳගෙන, එතුමාට එක එක දිරච්ච ලණු දෙන කණ්ඩායමට එතුමා නියම මාර්ගයට ගෙන යන්න පුළුවන් කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. නමුත්, අපේ රටට සෞභාග්‍යය සම්පන්න අනාගතයක් බිහි කිරීම සඳහා සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් ඇතුළුව අපි සියලුදෙනාම අනිවාර්යයෙන්ම සූදානම් කියන පණිවුඩය ලබා දෙනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් පුෂ්පකුමාර රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார - வெளிநாட்டு வேலைவாய்ப்பு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Jagath Pushpakumara - State Minister of Foreign Employment Promotion)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂ කාර්යාලය විසින් සකස් කරන ලද මේ විවාදයේ කථික ලැයිස්තුව ගැන මගේ කනස්සල්ල පළ කරනවා. මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මා විසින් සකස් කරන ලද කථාව තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය.

ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.*

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[පූ.භා. 11.51]

**ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சர் )
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයකින් අනතුරුව ජාතික ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ සුවිශේෂී ප්‍රතිපත්තිමය පියවරක් ලෙස මෙවර අය වැය අප සියලුදෙනාටම වැදගත් වෙනවා. මා දකින්නේ එක පැත්තකින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීමත්, අනෙක් පැත්තෙන් ජාතික ආර්ථිකය නිවැරැදි දිශානතියකට ගොනු කිරීමත් මෙන්ම, ජාතික අර්බුදයෙන් පීඩනයට පත් වෙලා ඉන්න ජනයා ක්‍රමක්‍රමයෙන් එයින් මුදා ගැනීමත් මෙම අවස්ථාවේ අප සියලුදෙනා වෙත පැවරිලා තිබෙන අභියෝගයක් බවයි.

2024 වර්ෂය මැතිවරණ පවත්වන වර්ෂයක් ද යන්න මෙම අය වැය සැකසීමේදී සැලකිල්ලට ලක් නොකළ යුතු කරුණක් බව මාගේ විශ්වාසය වන අතර ගරු ජනාධිපතිතුමා ද අය වැය කථාවේදී ඒ බව පවසා සිටියා. මෙවර අය වැය ඉදිරිපත් කිරීමේදී අප වෙත ඇති දේශපාලන බැඳීම් කෙරෙහි නොවෙයි, අප වෙත ඇති ජාතික වගකීම කෙරෙහි අපේ අවධානය යොමු කළ යුතු බව අය වැය කථාව පුරාවටම ගැබ් වෙලා තිබුණු ප්‍රබල සාධකයක්. ඒ නිසා අප සියලුදෙනාම මෙම අය වැය යෝජනා සහ එයින් ඔබ්බට කළ යුතු වගකීම් පිළිබඳව දැකිය යුත්තේ අප සියලුදෙනාම ඇඳ පැළඳගෙන ඉන්න විවිධ වර්ණ සහිත දේශපාලන කණ්ණාඩිවලින් නොවෙයි. අපි ඒවා පසෙකින් තියලා මේ අය වැය යෝජනා ගැන කල්පනා කළ යුතුයි කියා මා සිහිපත් කරනවා. මා සතුටු වෙනවා, විපක්ෂයේ රටට ආදරය කරන බුද්ධිමත් මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් එවැනි පදනමක ඉඳගෙන මෙම අය වැය පිළිබඳව මාධ්‍ය මඟින් විග්‍රහයක් කිරීම පිළිබඳව. එය හොඳ ප්‍රවණතාවක්. එම ප්‍රවණතාව අය වැයට ඡන්දය පාවිච්චි කරන අවස්ථාවේදීත් පවතීවි කියා අප විශ්වාස කරනවා.

නව ආර්ථික ආකෘතියක අවශ්‍යතාව අද රට හමුවේ පවතිනවා. ණය මුදල් මත යැපෙමින් සුබසාධන බෙදීයාම මත ගොඩනැඟුණු ආර්ථික මූලධර්ම මත පිහිටුවා දශක ගණනාවක් අපි අය වැය යෝජනා ගෙනාවා. අද අපේ තරුණ පරම්පරාව වසර 70ක දේශපාලන ශාපයක් පිළිබඳව කථා කරන අවස්ථා අපි දකිනවා. හැබැයි, අප දන්නා පමණින් මේ පාර්ලිමේන්තුවේ සිටින හැමදෙනාම විවිධ ක්‍රමවලින්, විවිධ ආකාරයෙන් එකී වසර 70 තුළ රාජ්‍ය බලය භුක්ති වින්ද අය. නූතන තරුණයා වසර 70ක් පුරා පැවැති අර්බුදය "දේශපාලකයා" යන සන්දර්භයට ලඝු කළත්, අප බුද්ධිමත්ව බැලිය යුත්තේ වසර 70ක් තුළ මෙම පාර්ලිමේන්තුව තුළින් අප ගත් ප්‍රතිපත්තිමය තීන්දුවල දුර්වල පැති මොනවාද කියන එකයි. මාරුවිය යුත්තේ සාම්ප්‍රදායික දේශපාලනඥයා පමණක් නොවෙයි. යල් පැන ගිය දේශපාලන ප්‍රතිපත්තිත් අපි මාරු කළ යුතුයි.

නව සංවර්ධන ආකෘතියක් වෙත මෙම අය වැය මඟින් ලබාගෙන ඇති ප්‍රවේශය අපි අගය කරන්න ඕනෑ. රාජ්‍ය සේවා අත්‍යවශ්‍යම අවස්ථා සඳහා පමණක් යොදාගෙන බදු බර අඩු රටක් වෙත ගමන් කිරීමත්, රාජ්‍ය සේවයේ ඵලදායීතාව වැඩි කිරීමත් සඳහා නව ආකෘති හා ඩිජිටල්කරණය වෙත වැඩිබරක් තැබීමත් අත්‍යවශ්‍ය වෙනවා.